## 1.14 ක්‍රි. ව. 18 සහ 19 සියවස්හි ශ්‍රී ලංකාවේ බටහිර සහ දකුණු වෙරළබඩ බෞද්ධ විහාරස්ථානයන්හි අන්තර්ගත යුරෝපීය කලා ලක්ෂණ.

වජිර නලින්ද ජයතිලක
දෘශ්‍ය කලා සහ ප්‍රාසංගික කලා ඒකකය, කැලණිය විශ්වවිද්‍යාලය

## ABSTRACT

බටහිර සහ දකුණු වෙරළබඩ බෞද්ධ විහාරස්ථානයන්හි චිත්‍ර, මූර්ති, ගෘහනිර්මාණ යන අංශයන්හි යුරෝපීය කලා මූලයන් සුලභ ව දක්නට ලැබීම විශේෂ ලක්ෂණයකි. බැරොක් ආකෘතියේ ද්වාර, සණ්ටාර කුළුණු , පිළිම ගෙයට පිවිසෙන දොරටුව දෙපස යෙදූ යුරෝපීය හමුදා රූප, යුරෝපීය රාජ්‍ය ලාංඡන, වික්ටෝරියා රැජිණගේ රුව , යුරෝපීය ලක්ෂණ සහිත ගෘහ අභ්‍යන්තර දර්ශන, ඇඳුම් පැළඳුම් , මල් මෝස්තර සහ මිදි වැල් ආදී සැරසිලි රටා ආදිය මේ අතර බහුල ය.

ක්‍රි. ව. 18 සහ 19 සියවස් වූ කලී යටත් විජිත පාලකයන් සහ ලාංකික බෞද්ධයින් අතර දැඩි එදිරිවාදිකම් සහ විරෝධතා පැවති කාල පරිච්ඡේදයක් විය. එබඳු පසුබිමක් තිබිය දී ත් බෞද්ධයින් වැඳුම් පිදුම් කරන ස්ථානවල අබෞද්ධ, යුරෝපීය මූලයන් බෞද්ධ කලාත්මක ප්‍රකාශනයන් සඳහා භාවිත කර තිබීම සංකීර්ණ මෙන් ම පරස්පර විරොධී ලෙස ද පෙනෙන කරුණකි. මෙම ලක්ෂණ අන්තර්ගත කිරීමට කලා ශිල්පීන්ට බල පෑ හේතු සාධක අවබෝධ කර ගැනීම සඳහා තත්කාලීන සාමාජීය, ආර්ථික, දේශපාලන සහ සංස්කෘතික සාධක පුළුල් ව විමසා බැලිය යුතු ය.

පහත රට ප්‍රදේශවලින් නව කොම්ප්‍රදෝරු පන්තියක් සහ නව නිකායන් පැන නැගීම මෙහි ලා ඉතා වැදගත් වන කාරණා ද්විත්වයකි. නව කොම්ප්‍රදෝරු පාන්තිකයින් ඉහළ සමාජ තත්ත්වයක් ලබා ගැනීම උදෙසා ක්‍රිස්තියානි ආගම වැළඳ ගෙන ව්‍යාපාර කිරීමට, නීත්‍යානුකූල විවාහ කර ගැනීමට, ළමුන්ට පාසල් අධ්‍යාපනය ලබා දීමට සහ පරිපාලනයේ උසස් ස්ථාන ලැබීමට වරප්‍රසාද හිමි කරගත් පිරිසක් විය. ඔවුහු යුරෝපීයන් යොමු නොවූ ක්ෂේත්‍ර වූ මිනිරන් පතල්, අරක්කු රේන්ද ආදී ව්‍යාපාරයන්හි නිමග්න ව විශාල වශයෙන් ආර්ථික වාසි ලැබූහ. එහෙත් ඔවුහු තම පැරණි බෞද්ධ විහාරස්ථානයන් සහ භික්ෂූන් සමඟ පැවති සම්බන්ධතා ද අඛණ්ඩව ම පවත්වා ගෙන ගියහ . උඩරට රාජධානියෙන් දුරස්තව පිහිටා තිබීම නිසාත් , අභ්‍යන්තරික ආරවුල් නිසාත් පහත රට විහාරස්ථානයන්ට රාජ්‍ය අනුග්‍රහය ලබා ගැනීම දුෂ්කර විය. එසේම පෘතුගීසීන්ගේ විනාශකාරී ක්‍රියා නිසා විහාරගම් අහිමි වීමේ ගැටළුවට ද මැදි ව සිටි පහතරට ප්‍රදේශවල විහාරස්ථාන ගණනාවක ම නව අනුග්‍රාහකයින් වී ඇත්තේ මෙම කොම්ප්‍රදෝරු පාන්තියයි. මෙසේ අනුග්‍රාහකයින් වීම නිසා ආගම අත් හැරීමෙන් වූ අවමානයෙන් ගැළ වී ස්වදේශිකයන් අතර සාමාජීය වශයෙන් වැදගත්කමක් ලබා ගැනීමට කොම්ප්‍රදෝරු පාන්තිකයන්ට හැකි වූ අතර භික්ෂූන් ද මෙම අනුග්‍රාහකත්වය සිය සාහිත්‍ය කෘති මගින් වර්ණනා කර තිබේ . කලා ශිල්පීන් නව අනුග්‍රාහකයින් සතුටු කිරීම සඳහා ඔවුන්ගේ රුචිකත්වට අනුරූප යථෝක්ත යුරෝපීය කලා මූලයන් බෞද්ධ විහාරස්ථානයන්හි අන්තර්ගත කරන්නට ඇති බව පෙනේ. ස්වදේශිකයින් අමනාප කර ගැනීම ආර්ථික කටයුතු සඳහා ඉතා අවාසිදායක විය හැකි බැවින් විශේෂයෙන් ම ලන්දේසීන් සහ ඉංග්‍රීසීන් මෙබඳු සම්බන්ධතාවයන් කෙරෙහි ලිහිල් ප්‍රතිපත්තියක් අනුගමනය කරන්නට ඇත.

උඩරට භික්ෂූ අධිකාරිය සහ පහත රට භික්ෂූන් අතර උපසම්පදාව ඈ කරුණු විෂයෙහි තිබූ විවිධ අර්බුද සහ ගැටළුවල ප්‍රතිඵලයන් ලෙස අමරපුර, කල්‍යාණිවංශ, රාමඤ්ඤ වැනි නව නිකායන් පහත රට ප්‍රදේශවලින් පැන නැගිණි. උඩරට කුලක්‍රමයට අනුව උසස් යැයි සම්මත නොවූ කුලවලට ද මේ නිසා භික්ෂූ ශාසනය විවර වීමත් එහි ප්‍රතිඵලයක් ලෙස නව විහාරාරාම ගොඩ නැගෙන්නටත් විය. මෙම ගොඩනැගිලි නිර්මාණයෙහි නියැලුණු පහත රට ප්‍රදේශවල කලා ශිල්පීන් ද කොම්ප්‍රදෝරු පාන්තිකයන්ගේ නිවාස, යුරෝපීය නිල නිවාස, ප්‍රභූ නිවාස, පල්ලි ආදිය ඉදි කිරීමට සම්බන්ධ ව සිටි පුද්ගලයින් වූ හෙයින් පහත රට ප්‍රදේශවල නිතර ඇස ගැටුණු යුරෝපීය සැරසිලි රටා විහාරාරාම අලංකරණයට ද යොදා ගන්නට ඇත.

තව ද කරතොට හිමි වැනි ඇතැම් පහත රට ප්‍රධාන පෙළේ භික්ෂූන් යුරෝපීය පාලකයින් සමඟ පැවැත්වූ සමීප සම්බන්ධතා යුරෝපීය කලා මූලයන් පහතරට විහාරාරාම තුළට පිවිසීමට බල පෑ තවත් හේතුවක් විය. මෙම සම්බන්ධතාවල ප්‍රතිඵල ලෙස ඇතැම් ලන්දේසි ආණ්ඩුකාරයින් විසින් පහත රට විහාරාරාමයන්ට මූල්‍යමය ප්‍රතිපාදන පවා ලබා දී තිබේ.